---

**ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 සැප්තැම්බර් 17 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 13 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ). රු.100,000 ක් වටිනාකම වූ පුස්තකාල පොත් තොගයක් හා වටිනාකම නිශ්චය නොකල ස්ථාවර වත්කම් විෂයයන් 21 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ). ජංගම වගකීම් ලෙස දැක්විය යුතු රු.4,175,207 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර ජංගම වත්කම් රු.207,000 කින් අඩුවෙන් දක්වා තිබුණි

(ඇ). උසාවි දඩ හා නළලිං ආදායම රු.114,149 ක් වැඩියෙන්ද කඩකුලී ආදායම රු.90,400 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඈ). ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය හා ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය එකිනෙකට සමාන විය යුතු වුවත් රු.152,258 ක වෙනසක් පැවතුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව වූ රු. 3,619,930 ක්වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය/සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.373,652 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,901,271 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). වලංගු කාලය ඉක්මවූ රු.123,942 ක් වටිනා චෙක්පත් 52 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 180 ප්‍රකාරව මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හෝ ආදායම් පිළිබඳ රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි.

(ඇ) 2006 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව රු21,520 ක්වූ මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් බදු | 1,117 | 1,070 | 2,551 |
| (ii). | බදු කුලී | 2,115 | 2,351 | 395 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 755 | 734 | - |
| (iv). | වෙනත් ආදායම් | 7,126 | 7,171 | 2,310 |

**2.3.2 බදුකුලී**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(i) වගන්තිය ප්‍රකාරව රු.3,463,161 ක්වූ හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු. 1,792,575 ක් ලැබිය යුතුව තිබුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ජේදයේ 13.7 වගන්තිය ප්‍රකාරව විධිමත් පත්කිරීමක් නොමැතිව ලේකම්ධුරයේ වැඩ බැලීමේ වැටුප් වශයෙන් සංවර්ධන සහකාරවරයෙකුට වසර 06 ක් සඳහා එකතුව රු.280,420 ක් ගෙවා තිබුණි.

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 203 හා 214 ප්‍රකාරව සභාවේ ගබඩා, දේපල, වත්කම් සහ අනෙකුත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ හරි වැරදි බැලීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ). පළාත් පාලන කොමසාරිස්ගේ 1994 අගෝස්තු 04 දිනැති අංක NCP/PL/4/7/19 දරන චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු කඩ කාමර වසර 05 කට වරක් තක්සේරු කර බදුකුලි සංශෝධනය කර නොතිබුණි.

(ඇ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.6** සභාවට එරෙහිව නෛතික කටයුතු

(අ) ව්‍යාපෘතියක ඉදිකිරීම් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් නොකර, පැහැර හැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයක් විසින් සභාවට එරෙහිව වන්දි ඉල්ලා පවරා තිබුණු නඩුවල තීන්දු අනුව සභාව විසින් වන්දි ගෙවීමට සිදුවී තිබුණු අතර තවදුරටත් ගෙවිය යුතු වන්දි මුදල රු.4,175,206 ක්ව පැවතුණි.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියේ පිලිසරු ව්‍යාපෘතිය සඳහා 2011 වර්ෂයේදී ලැබුණු රු.1,280,163 ක මුදල බැංකු ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. කොන්ත්‍රාත්කරුවකු සභාවට එරෙහිව පවරා තිබූ නඩුවක් අනුව අනුරාධපුරය දිසා අධිකරණය විසින් මෙම බැංකු ගිණුම තහනම් කර තිබුණි.

## 2.7 කොන්ත්‍රාත් පරිපාලනය

මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුමත වී තිබුණු රු.5,700,000 ක් පිරිවැය වූ ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය.

(ඇ). වත්කම් කළමනාකරණය